සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අනාවරණ පරීක්ෂණය - 2026
இனங்காணல் பரீட்சை - 2026
Diagnostic Test - 2026

22254

ශ්‍රේණිය தரம் Grade	11	විෂය பாடம் Subject	සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය வினாத்தாள் Paper	I	කාලය காலம் Time	පැය 01යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

I කොටස සඳහා උපදෙස්:

- ★ **I කොටසේ සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.**
- ★ **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා එහි යටින් ඉරක් අඳින්න.**
- ★ **I කොටස සඳහා මුළු ලකුණු 40කි.**

★ **අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත යෙදුම්වල අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

1. සියාතුහාමි අතමාරුවක් ඉල්ලා ගැනීමට මුදියන්සේ මහතාගේ නිවසට ගියේ ඉමහත් බලාපොරොත්තුවෙනි.
   (1) අත් උදව්වක් (2) පිහිටක් (3) ණය මුදලක් (4) උපකාරයක්

2. නිවසේ නතරව හුන් ආගන්තුකයා පැදුරටත් නොකියා පිටත්ව ගොස් තිබුණි.
   (1) කරදරයකින් තොරව (2) කාටත් නොදන්වා (3) හිමිදිරි පාන්දර (4) පැදුර එළා තිබියදීම

3. සුන්දරහාමිට මුළු සේසතම අහිමි වූ බව අම්මා කීවාය.
   (1) සේසත් සියල්ලම (2) සියලුම මුදල් (3) ඉඩම් කඩම් සියල්ලම (4) සම්පත් සියල්ලම

★ **අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු වචනය තෝරන්න.**

4. ප්‍රාදේශීය සභාව නගරයේ කැලි කසළ ගැටලුව ..... කිරීම සඳහා පිළියම් සෙව්වේය.
   (1) විශේෂීකරණය (2) සාමාන්‍යකරණය (3) නිරාකරණය (4) ප්‍රතිසංස්කරණය

5. කලාපීය ප්‍රගති .....රැස්වීම පසුගිය දා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.
   (1) සමාලෝචන (2) සංක්ෂිප්ත (3) සමීක්ෂණ (4) කාර්යක්ෂමතා

6. විස්තරාත්මක ඡේදයක් ..... දැක්වීම සාරාංශකරණය වේ.
   (1) පැහැදිලිව (2) ලුහුඬින් (3) සම්ප්‍රේෂණයෙන් (4) සංශ්ලේෂණයෙන්

7. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව දැක්වෙන උත්තරය තෝරන්න.
   (1) මර්දනය, වර්ධනය, බිහිසුනු, මධ්‍යකාලීන (2) ඓන්ද්‍රීය, පරිශීලනය, ව්‍යංගාර්ථය, දුරකථනය
   (3) ගැහැනිය, පිළිසරණ, වෙළෙඳාම, හිරු කිරණ (4) සම්ප්‍රධාය, හෘදයාංගම, ප්‍රශ්වාස, විමර්ශනය

8. දේශය, රූපය, ඍතුව, නෞකාව යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් දක්වන උත්තරය තෝරන්න.
   (1) කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ පාපිල්ල, ගැටය සහිත ඇලපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත.
   (2) කොම්බුව හා හල් කිරීම, දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය.
   (3) කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ ඇදය, ගැටය සහිත ඇලපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත.
   (4) කොම්බුව සහ හල් කිරීම, දීර්ඝ ඇදය, ගැටය සහිත ඇලපිල්ල, කොම්බුව සහ ගයනුකිත්ත

CamScanner

9. 'කතුර' යන වචනයේ අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග පිළිවෙළින් දැක්වූ විට,
(1) කණ්ඨජ, මූර්ධජ, ඕෂ්ඨජ (2) තාලුජ, කණ්ඨජ, මූර්ධජ
(3) කණ්ඨජ, දන්තජ, මූර්ධජ (4) තාලුජ, ඕෂ්ඨජ, කණ්ඨජ

10. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව වචන පෙළ ගස්වා ඇති උත්තරය වන්නේ,
(1) කඩුවෙල, බත්තරමුල්ල, මහව, ගාල්ල (2) ඉළිඹ, අම්පාර, බුත්තල, ඊරියගම
(3) අකුරණ, අංගොඩ, අම්පාර, අඹේපුස්ස (4) කහතුඩුව, නාගොඩ, මාතලේ, යාපනය

11. 'අමරපාල පිනට හිතැති මිනිසෙකි' යන වාක්‍යයේ 'හිතැති' යන්න අයත් වන්නේ,
(1) ආගම සන්ධියටය. (2) පූර්ව රූප සන්ධියටය.
(3) පූර්ව ස්වර ලෝප සන්ධියටය. (4) ද්විත්ව රූප සන්ධියටය.

12. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති උත්තරය තෝරන්න.
(1) මිතුරන්, තා, තෙරණුවන්, ලේඛිකාවක. (2) ඇතෙකු, වවුලකු, සිසුවෙක්, කතක.
(3) ලියන්, මෑණියන්, තරුණියන්, ශිෂ්‍යාව. (4) හෙදියන්, සිංහයෙක්, ඔවුන්, මොවුන්.

13. 'පුතා සිඟන්නෙකුට ආහාර දෙයි' යන වාක්‍යයේ 'සිඟන්නෙකුට' යන වචනය අයත් වන්නේ,
(1) ප්‍රථමා විභක්තියටයි. (2) ආලපන විභක්තියටයි. (3) කර්තෘ විභක්තියටයි. (4) සම්ප්‍රදාන විභක්තියටයි.

14. 'නාගරික' යන්නෙහි ප්‍රකෘතිය හා ප්‍රත්‍යය නිවැරදිව දැක්වෙන උත්තරය තෝරන්න.
(1) නාගර්+ඉක (2) නගර+ඉක (3) නාගරි+ක (4) නගරි+ඉක

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත උත්තරය තෝරන්න.
(1) තද්ධිත - නිරෝගිමත්, ධනවත්, නොවසන, ප්‍රාථමික. (2) මිශ්‍ර ක්‍රියා - දුවමින්, කකා, ගය ගයා, යමින්.
(3) නිපාත - සමඟ, තෙක්, පටන්, පතා. (4) ආගම සන්ධිය -දෙයාකාර, සූවසූ, වියවුල්, පුටුව.

16. 'වැසි වසිද්දී පියා නිවසට පැමිණියේය.' මෙහි 'වසිද්දී' යනු,
(1) පූර්ව ක්‍රියා පදයකි. (2) මිශ්‍ර ක්‍රියා පදයකි.
(3) අසම්භාව්‍ය ක්‍රියා පදයකි. (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා පදයකි.

★ අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය වඩාත් නිවැරදිව දැක්වෙන උත්තරය තෝරන්න.

17. මේක හරිම රසවත් වෘත්තාන්තයක්.
(1) කතාවක්. (2) වෘත්තාකාර දෙයක්. (3) අතුරුපසක්. (4) ක්‍රීඩාවක්.

18. දානමය පින්කම සිදු කර ඔහුගේ මනදොළ සපුරා ගත්තේය.
(1) සීත දිය පහර (2) සිතෙහි වූ දැඩි කැමැත්ත (3) මනසෙහි වූ අඩුවක් (4) මනස නමැති දිය පහර

19. ඔහු නිරහංකාර පුද්ගලයෙකි.
(1) අහංකාර නැති. (2) අහංකාරබවින් යුතු (3) ආභරණ නොපලඳින (4) දැනුම නොමැති

20. දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා දේ ඇතුළත් උත්තරය තෝරන්න.
(1) නියන, යත්ත, පීර, වෑය. (2) කරාබුව, මාලය, මුද්ද, වළල්ල
(3) සරම, කමිසය, ගවුම, කලිසම (4) පෑන, පැන්සල, මකනය, පින්සල.

21. සමානාර්ථ පද යුගලයන් පමණක් යෙදී ඇති උත්තරය තෝරන්න.
(1) තරිඳු - දිනිඳු, මුහුද - සරසි, ගව - ගෝ, සයුර - රුවනාර.
(2) සතුර - රුපු, අනංගයා - මලවි, අලියා - කණේරු, නිශා - රාත්‍රිය.
(3) ගස - දුම, සිංහ - ලෝචන, ඇස - සිළු, කුරුලු - පක්ෂි.
(4) දිය - ජල, කුකුළු - සැවුල්, ප්‍රසිද්ධ - පවර, මුතු - පළිඟු.

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) චන්ද්‍ර - සිසි, තරුපති, සොමි, නිශාචර. (2) පියුම - තඹර, සියපත, අරවින්ද, පංකජ.
(3) මව - මෑණි, මව්, මාතා, ජනනි. (4) අහස - නුබ, ගගන, අඹර, සුරමග.

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් වන උත්තරය තෝරන්න.
(1) මන්ත්‍රණ - සම්මන්ත්‍රණ (2) ප්‍රයෝග - විප්‍රයෝග
(3) හැවිලි - ආසි (4) කටුක - කයෝර

CamScanner

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'තොපි' යනු මධ්‍යම පුරුෂ බහු වචන පදයකි.
(2) 'බ' යනු ඕෂ්ඨජ අක්ෂරයකි.
(3) 'නැටුවෙහි' යනු මධ්‍යම පුරුෂ අතීත කාල ඒක වචන පදයකි.
(4) 'කඩති' යනු කෘදන්ත පදයකි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරින් මනා පද ගැළපීමක් සහිත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) රමණීය අරුතකින් දැනවෙන ලෙස කරන නිර්මාණය කවියයි.
(2) පැරණි ජීවනෝපාය බොහෝ විට ආගමික පරිසරයට අනුව සකස් වී ඇත.
(3) උතුරු ඉන්දියානු ජනයාත් මේ දිවයිනට සංක්‍රමණය වීමටත් පෙර සිටත් හේන් ගොවිතැන පැවතිණි.
(4) සාහිත්‍යකරුවන්ගේ ප්‍රතිභාවෙන් ප්‍රකට කළ හැකි ප්‍රධාන මාධ්‍යය වන්නේ භාෂාවෙනි.

★ **අංක 26 සහ 27 ප්‍රශ්නවල මුලින් දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

26. පිළිකුලෙන් හා නොසැලකිල්ලෙන් ප්‍රතිචාර දැක්වීම.
(1) එපා වාහෙට හොදි බෙදන්නා වාගේ.
(2) ආදා මාළු ඉරටුවෙන් කන්නා වාගේ.
(3) උගුරට හොරා බේත් කන්නා වාගේ.
(4) පල නොකියා පලා බෙදන්නා වාගේ.

27. නොගැළපෙන දෙදෙනෙකුගේ එකතුවක්.
(1) කිරි මුහුදට හඳ පෑව්වා වාගේ.
(2) එළ හරකයි මී හරකයි වාගේ.
(3) රයිගමයයි ගම්පොළයයි වාගේ.
(4) ජාඩියට මූඩිය වාගේ.

28. පූර්ව රූප හා ස්වරාදේශ සන්ධිවලට අදාළ නිදසුන් දෙකක් පිළිවෙළින් ඇතුළත් උත්තරය තෝරන්න.
(1) අත්තම්, ජීවනෝපාය (2) දඩයම්, කම්මල (3) දෑත, ගෙත්තම් (4) අමාත්‍යාංශය, සත්තු

★ **අංක 29 සහ 30 ප්‍රශ්නවල දී ඇති වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

29. (1) ගංගා තෙමේ මුහුදට ගලා ගියේය.
(2) සමහර මිනිස්සු ආත්මාර්ථකාමීය.
(3) ළමයි ගුරුතුමියක් කැඳවා ගෙන ආවාය.
(4) අප කුමක් කරමිද?

30. (1) ගුරුවරයෙක් දරුවෙක් කැඳවන්නේය.
(2) සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා !
(3) දද පෙළ නගරය අලංකාර කරති.
(4) අයෙක් අප මග හැර යයි.

31. නිපාත පද සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) නිපාත පද වාක්‍යයක මුල, මැද, අග යන තුන් තැනෙහිම යෙදේ.
(2) නිපාත පද ඇතැම් විට වාක්‍යයක අනෙක් පදවලින් වෙන් කොට ලියනු ලැබේ.
(3) නිපාත පද විභක්තිවලත් කාලභේදයෙහිත් වර නැගිය හැකිය.
(4) නිපාත පද මඟින් වාක්‍යයක පද අතර අර්ථවත් සම්බන්ධතාව ප්‍රකට කරයි.

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වාක්‍යය වන්නේ කුමක්ද?
'මං ගෙදර ගිහින් පොත් ටිකත් අරං එන්නං කියලා සමන් කිව්වා'
(1) 'තමා ගෙදර ගිහින් පොත් ටිකත් අරන් එන්නම්' කියා සමන් කීවේය.
(2) සමන් පැවසුවේ 'නිවසට ගිහින් පොතුත් අරන්' එන්නම් කියායැ.
(3) 'මම ගෙදර ගිහින්, පොත් ටිකත් රැගෙන එමි'යි සමන් පැවසීය.
(4) තමා නිවසට ගොස් පොත්ද රැගෙන එන බව සමන් කීවේය.

33. මහනුවර දළදා පෙරහැරෙහි 'රන්දෝලි පෙරහැර' නමින් හැඳින්වෙන්නේ,
(1) සතර දේවාලයන්හි දේවාභරණ වැඩමවන වාහනද සහිත පෙරහැරයි.
(2) කරඬුව වැඩමවන ඇතා රන් ආභරණයෙන් සරසා පෙරහැරේ ගමන් කරවන පෙරහැරයි.
(3) දළදා වහන්සේ වැඩ සිටින රන් කරඬුව ඇතා පිට වැඩමවන පෙරහැරයි.
(4) කරඬුව රන්දෝලියක තබා වැඩමවන පෙරහැරයි.

34. "කුඹුයොත් සයුර බොත එහි මිණි සේ අනත
නුඹ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන වත
සැදෑ සඳුට සඳමින් මග නිසා කත
ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුත"
මෙම පද්‍යය ඇතුළත් වන්නේ,
(1) මයුර සන්දේශයේය.
(2) හංස සන්දේශයේය.
3) සැළලිහිණි සන්දේශයේය.
(4) පරෙවි සන්දේශයේය.

CamScanner

35. "උඹේ කරට මල් මාලා ගොතන්නට
මදු මල් පිපෙනවා හේනේ වැට දිගට"

මෙහි ඇතුළත් අලංකාරය වන්නේ,

(1) උපමාලංකාරයයි.
(2) රූපකාලංකාරයයි.
(3) උත්ප්‍රේක්ෂාලංකාරයයි.
(4) ස්වභාවෝක්ති අලංකාරයයි.

36. ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර ශ්‍රීමතාණන් පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ලංකාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයාය.
(2) පේරාදෙණිය විශ්ව විද්‍යාලය ස්ථාපනය කළේය.
(3) අප රටේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ස්ථාපනය කිරීමේ පුරෝගාමියාය.
(4) ගුරුවරයකු වශයෙන් වෘත්තීය ජීවිතය ආරම්භ කළේය.

37. 'සාහිත්‍ය විද්‍යාව' නම් කෘතියේ රචකයා වන්නේ,

(1) මහගම සේකරයන්ය.
(2) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන්ය.
(3) කේ. ජයතිලකයන්ය.
(4) එදිරිවීර සරච්චන්ද්‍රයන්ය.

38. මොනරාගල ජන වහරෙහි 'පුහුල්' යන්නෙන් අදහස් වන්නේ පොදු සිංහලයෙහි,

(1) අළු පුහුල්
(2) වට්ටක්කා
(3) දියලබු
(4) ගස්ලබු

39. "ඒ මිහිපල් තෙමේ සතියක් පුරා නා නා පූජා සත්කාර කරවා, තෙරුන්ගේ බද්ධ මාලක නම් තැන සුවඳ දර සෑයක් කරවා, මනරම් කුළු ගෙය එහි පමුණුවා ... දර සෑයෙහි තබ්බවා අවසන් ගරු බුහුමන් කෙළේය."

මහා වංශයෙන් උපුටා ගත් මෙම කොටසෙහි දැක්වෙන පරිදි ගරු බුහුමන් සිදු කළේ,

(1) කලිකල් සවැනි නිරිඳුය. (2) දෙවනපෑතිස් මහ රජුය. (3) උත්තිය රජුය. (4) මහ පැරකුම් රජුය.

40. "භාෂාවක භාෂණ ව්‍යවහාරය හා ලේඛන ව්‍යවහාරය යනුවෙන් ව්‍යවහාරද්වයකි. මෙයින් භාෂණය ප්‍රාථමික වන අතර ලේඛනය ද්විතීයික වේ. භාෂණය පුළුල් පරාසයක ව්‍යාප්තව පවතී"

ඉහත දැක්වෙන පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

(1) භාෂාවක තිබෙන භාෂණය හා ලේඛනය යන ව්‍යවහාර දෙක අතරින් භාෂණය මූලික වන අතර එය වඩාත් පුළුල් පරාසයක පැතිර පවතී.
(2) භාෂාවක භාෂණ ව්‍යවහාරය ප්‍රාථමික වන අතර එය වඩාත් පුළුල් පරාසයක විහිදී ඇත.
(3) වඩාත් පුළුල් පරාසයක් විහිදී ඇත්තේ භාෂණය වන අතර ලේඛනය ද්විතීයික වේ.
(4) භාෂණය පුළුල් පරාසයක ව්‍යාප්තව පවතින අතර එය ප්‍රාථමික වන බැවින් ලේඛනය ද්විතීයික වේ.

CamScanner

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

අනාවරණ පරීක්ෂණය - 2026
இனங்காணல் பரீட்சை - 2026
Diagnostic Test - 2026

22243

ශ්‍රේණිය தரம் Grade	විෂය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
11	සිංහල භාෂාව හා සාහිත්‍යය	II	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

II කොටස සඳහා උපදෙස්:

ප්‍රශ්න සියල්ලටම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

01) අංක (i) සිට (X) තෙක් ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ,
  (අ) අඝෝෂාක්ෂර දෙකක්ද,
  (ආ) ඌෂ්මාක්ෂර දෙකක්ද ලියන්න.

(ii) පහත දැක්වෙන පාඨයෙන් උපසර්ග සහිත පද දෙකක් උපුටා ලියන්න.
"සාමාන්‍ය සතුන්ගේ අඩි සලකුණු අතර සුවිශේෂ විසල් අඩි සලකුණු දුටුවහොත් මා අනිවාර්යයෙන්ම හඹා යන්නේ ඒ විසල් අඩි සහිත සත්ත්වයාය"

(iii) පහත දී ඇති සන්ධි පද විසන්ධි කරන්න.
  (අ) පුනරුච්චාරණය (ආ) නෙලුම්දණ්ඩ

(iv) පහත (අ) යටතේ දැක්වෙන වාක්‍යය කර්තෘ කාරකයටත් (ආ) යටතේ දැක්වෙන වාක්‍යය කර්ම කාරකයටත් හරවා ලියන්න.
  (අ) විදේශිකයෙකු විසින් වන සත්තු නරඹනු ලැබූහ.
  (ආ) තරුණයෝ රැකියා ඉල්ලා උද්ඝෝෂණය කරති.

(v) ධීවර කර්මාන්තය හා සම්බන්ධ භාෂාවේ භාවිත වන පහත සඳහන් වචන සඳහා පොදු ජනවහර ලියන්න.
  (අ) ජාලය (ආ) අම්බාවෝ

(vi) පහත දැක්වෙන වාක්‍යයෙහි පද දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.
"මහේස්ත්‍රාත්වරයා පැවසුවේ එහි නීත්‍යානුකූලභාවය පිළිබඳ නිරීක්ෂණය කිරීම අත්‍යාවශ්‍යබවයි"

(vii) පහත අදහස දීම සඳහා සුදුසු තද්ධිත පද ලියන්න.
  (අ) දෙදෙනෙකු අතරින් ශ්‍රේෂ්ඨයා
  (ආ) සියල්ල අතරින් ශ්‍රේෂ්ඨයා

(viii) අකාරාදී පිළිවෙළට සකසන්න.
  (අ) පූජාවලිය, අමාවතුර, බුත්සරණ, ධර්මප්‍රදීපිකාව
  (ආ) තේක්ක, බුරුත, කොස්, දෙමට

(ix) පහත සඳහන් වචන දෙකෙහි අර්ථය පැහැදිලි වන සේ වාක්‍යය බැගින් තනන්න.
  (අ) හෙල
  (ආ) හෙළ

(x) පහත සඳහන් අදහස්වලට උචිත ඡාත්‍ර පදය බැගින් ලියන්න.
  (අ) දියෙහිත් ගොඩබිමෙහිත් වාසය කරන සත්ත්වයින්
  (ආ) අහසත් මුහුදත් එකට ගැවෙන සේ පෙනෙන ස්ථානය

(ලකුණු 2 × 10= 20)

CamScanner

02) පහත දැක්වෙන (අ), (ආ), (ඇ), (ඈ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට වැඩි වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා සුදුසු මාතෘකාවක්ද යොදන්න.

(අ) අප රටෙහි භාවිත කෙරෙන ප්‍රධානතම බලශක්ති මූලයක් වන විදුලිය, පරිභෝජනය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. අවිධිමත් පරිභෝජන රටා හා වංචනික ක්‍රියා නිසා අපතේ යන විදුලිය ඒකක ප්‍රමාණයද සුළුපටු නොවේ. අධික විදුලිය බිලක් ගෙවීමෙන් හා නිතර නිතර විදුලිය කප්පාදුවට මුහුණ දීමෙන් මෙහි ප්‍රතිවිපාක විඳින්නෝ පොදු මහජනතාවය. මේ අනුව අයථා ලෙස විදුලිය භාවිත කරන්නන්ට නිසි දඬුවම් පැමිණවීමත් අරපිරිමැස්මෙන් විදුලිය පරිභෝජනයට මහජනතාව පෙළඹවීමත් කඩිනමින් කළ යුතුව තිබේ.

(ආ) රටක සංවර්ධනයේ වැදගත් අංගයකි, ගමනාගමනය. වර්තමානයේ අප රටේ පවත්නා ඉන්ධන අර්බුදය හේතු කොට ගෙන පොදු ප්‍රවාහන සේවය සංවර්ධනයට විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර පොදු ගමනාගමන ක්‍රම ගැන අසන්නට ලැබෙන චෝදනා පිළිබඳවද අවධානය යොමු කර එය විධිමත් කළ යුතුය. වැඩිවන මගීන් සංඛ්‍යාව, මාර්ග තදබදය, රියදුරන් නීතිගරුකබවින් දුරස් වීම වැනි විවිධ අංශ පොදු ප්‍රවාහනය සම්බන්ධ ගැටලුවෙහි ප්‍රධාන තැනක් ගන්නා අතර මෙයට උත්තර සෙවීමේදී මහජන සහයෝගයද ඉතාම වැදගත් වේ.

(ඇ) නොමිලේ ලැබෙන හුස්ම පොද පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වන මිනිසා එම හුස්ම පොද පිරිසිදු කරන ගස අපේ මිතුරකු බව අමතක කර ඇත්තා සේය. 'ගස රැකුණොත් අප රැකේ' යන්න අපේ පැරැන්නන් හිස් මුදුනින් සැලකූ බැවින් නිල්ල පිරි රටක් අපට උරුම විය. මිහිමත ජීවය පවතින්නේ ගස්වැල් පැවතුණහොත් පමණි.

(ඈ) දහම් දිවයිනක් ලෙස විරුදාවලිය ලද අප රටේ දිනපතා සිදුවන අපරාධ අඩුවන බවක් පෙනෙන්නට නැත. ආත්මාර්ථකාමය හමුවේ විවිධ හේතූන් මත අපරාධ ජීවනෝපාය කරගත් අයද සිටිති. බල අරගලයද ක්ෂණික කෝපයද නිරතුරුවම අපරාධයන්ට මූල බීජ සපයන තත්ත්වයක් තුළ නීතිගරුකබව හා සාරධර්මයන් අප සමාජයෙන් නික්ම යයි. මෙම අපරාධ වැලැක්වීමට ජනතාවගේ නැඹුරුව නීතිය අබිබවා ඉදිරියෙන් සිටී.

(ලකුණු 25)

03) පහත දැක්වෙන පාඨය වචන 50ත් 60ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණනද උත්තරය අග ලියන්න.

ජනශ්‍රැති යනුවෙන් අප හඳුන්වනු ලබන ජන සම්ප්‍රදායන් සියල්ල තුළින් මූලිකවම සිදු කරනු ලැබ ඇත්තේ එක් පරම්පරාවක් විසින් ලබා ගන්නා ලද සමස්ත දැනුම් පද්ධතිය ඊළඟ පරම්පරාව සඳහා උරුම කොට දීම ය. මෙම දැනුම් සම්භාරය යනු එක් අංශයක එක පැතිකඩක් පමණක් සම්බන්ධ වූ ඒවා නොවීය. එහෙයින් කුමන ජනශ්‍රැතියක් විශ්ලේෂණයට භාජන කරනු ලැබුවත් යම් අංශයක් හා බැඳි දැනුම ඒ වටා ගොනු වී ඇති බව දැකිය හැකි වනු ඇත. මින්නේරිය වැව වේවා, කලා වැව වේවා, සොරබොර වැව වේවා ආශ්‍රය කොටගත් ජනප්‍රවාද සලකා බැලූ කල්හි ඒවායෙහි විනිවිද දැකිය හැක්කේ පැරැන්නන් වැව් බැඳීම සඳහා යෝග්‍ය ස්ථාන නිශ්චිත කොට හඳුනා ගැනීම පාදක කොටගත් කරුණු ය, වැව් බැඳීම සඳහා යොදාගත් තාක්ෂණික ක්‍රමවේදයන් ය, අනුගමනය කළ සිරිත් විරිත් ය, ඉටු කරන ලද පුද පිළිවෙත් ය. අනුරාධපුරය වේවා, පොළොන්නරුව වේවා, දඹදෙණිය වේවා අගනුවර ඇසුරු කොටගත් ජනප්‍රවාද මගින් අපට ආරක්ෂා සහිත ජයග්‍රාහී රාජකීය අගනුවරක් ඉදි කිරීම සඳහා යෝග්‍ය තැන් සොයා ගැනීමට යොදා ගත් දැනුම් සම්භාරය මෙන් ම එම නගර ඉදි කිරීම සඳහා කරන ලද සැලසුම් හා උපයෝගී කොටගත් ක්‍රමවේද පිළිබඳවද අවබෝධයක් ලද හැකි ය.

(ලකුණු 10)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

CamScanner

04) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

සත්‍ය සිද්ධියක් නැතහොත් සම්පූර්ණයෙන් කල්පිත ස්වරූපයෙන් හෝ නිර්මාණය කරනු ලබන හෙයින් නවකතාව, කෙටි නව කතාව, කෙටි කතාව යන සාහිත්‍යාංග තුන ද ප්‍රබන්ධ කතා හෙවත් කල්පිත කතා ගණයට වැටේ. දීර්ඝ ඉතිහාසයක් ඇති මේ ප්‍රබන්ධ කතාව විකාසනය වීමෙන් පළමුව නව කතාව ද, ඉක්බිති නව කතාවේ ශාඛා දෙකක් වශයෙන් කෙටි කතාව හා කෙටි නව කතාව ද යන නව සාහිත්‍යාංගත්‍රය ඒවාට ම විශේෂ වූ ශිල්පධර්ම සහිතව දියුණු වූයේය. කෙටි කතාව දහනව වන ශතවර්ෂයේ දී ආරම්භ වී ඇත. අද වන විට ලෝ පුරා ව්‍යාප්ත ජනප්‍රිය සාහිත්‍යාංගයක් බවට කෙටි කතාව පත්ව ඇත.

(i) කෙටි කතාවේ ආරම්භය සිදු වූ බව සැලකෙන ශතවර්ෂය කුමක්ද?

(ii) නව කතා, කෙටි කතා යන සාහිත්‍යාංග ප්‍රබන්ධ කතා ලෙස සලකන්නේ ඇයි?

(iii) මෙහි සඳහන් සාහිත්‍යාංගත්‍රය නම් කරන්න.

(iv) මෙම ඡේදයේ මූලික අරමුණ කුමක්ද?

(v) පහත පදවල අදහස ලියන්න.

(අ) කල්පිතයක් - (ආ) විකාසනය -

(ලකුණු 2 × 5 = 10)

05) ඔබේ පාසලේ පැවැත්වෙන නවෝත්පාදන විද්‍යා ප්‍රදර්ශනය විවෘත කිරීමට පැමිණෙන ලෙස දන්වා කලාප අධ්‍යක්ෂතුමා වෙත යවන ආරාධනා පත්‍රය සකසන්න. ඔබ ප්‍රදර්ශන කමිටුවේ ප්‍රධාන සංවිධායක ලෙස සිතන්න. (ස්ථානය, දිනය, වේලාව පිළිබඳ අවධානය යොමු කරන්න.)

නැතහොත්,

ඊරියගොල්ල සිට මාවතගම තෙක් වැටී ඇති මාර්ගය බෙහෙවින් අබලන් තත්ත්වයේ පවතී. දිනපතා රැකියා සඳහා ගමන් ගන්නා වැඩිහිටියන්ටද පාසල් යන දරුවන්ටද විවිධ අසීරුතාවන්ට පත් වීමට සිදුව ඇත. එම මාර්ගයේ ගමන් ගන්නා එකම බස් රථයේ ගමන් වාරද මේ වන විට නතර කොට ඇත්තේ මාර්ග අපහසුතා නිසාය. මෙම මාර්ගය කඩිනමින් සකස් කර දෙන ලෙස ඉල්ලා ඊරියගොල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත යවන ලිපිය ලියන්න. ලිපිය ලියන ඔබ ග්‍රාමෝදය සමිතියේ ලේකම් නිමල් හේවාවිතාරණ යැයි සිතන්න.

(ලකුණු 15)

CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කණම්
Department of Education - Western Province

අනාවරණ පරීක්ෂණය - 2026
இனங்காணல் பரீட்சை - 2026
Diagnostic Test - 2026

22247

ශ්‍රේණිය தரம் Grade	විෂය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
11	සිංහල භාෂාව හා සාහිත්‍යය	III	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

උපදෙස්: 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් වශයෙන් ප්‍රශ්න පහකට උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01) (i) සිට (x)තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) උම්මග්ග ජාතක කථාවෙහි සඳහන් පරිදි පහත නම් සඳහන් රජවරුන්ගේ පාලන ප්‍රදේශ ලියන්න.
(අ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමා
(ආ) වේදේහ රජතුමා

(ii) රෑ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ නාද නූ පා තබ තබා
(අ) මෙම පැදියේ සඳහන් විරිත නම් කරන්න.
(ආ) මෙහි ඇති උපමාවක් ලියන්න.

(iii) (අ) කුඩලිගම කවියා ආභාසය ලද භාරතීය කවියා නම් කරන්න.
(ආ) කුඩලිගම විසින් සංස්කරණය කරන ලද කවි සඟරාව කුමක්ද?

(iv) (අ) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක ලියන්න.
අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙළා
.....
.....
(ආ) සුත්ත නිපාත අට්ඨ කථාව හඳුන්වන වෙනත් නමක් ලියන්න.

(v) "මං අහපු ආරංචියක් නැහැ. කාගෙන්ද ආරංචි අහන්නේ?"
(අ) මෙහි සඳහන් වන ආරංචිය කුමක්ද?
(ආ) මෙම උද්ධෘතය සඳහන් ග්‍රන්ථයේ කතුවරයා කවුද?

(vi) (අ) සිංහබාහු නාට්‍යය අයත් නාට්‍ය සම්ප්‍රදාය කුමක්ද?
(ආ) විචාරක මතය අනුව මෙම නාට්‍යය තුළ දිවෙන යටිපෙළ අරුත කුමක්ද?

(vii) (අ) මහෞෂධ පඬිතුමාගෙ ධර්ම යුද්ධයට යෑම සඳහා නොයෙක් රසයෙන් යුතු භෝජන පිළියෙල කළේ කවුරුන්ද?
(ආ) බ්‍රහ්මදත්ත රජුට එකොළොස්වැනිව හිඳ අනුශාසනා කරන්නේ කවුරුන්ද?

(viii) "නොබව මහ රජ, නොබව මහ රජ. මේ දැන් කිහිඹියකු දු දිවි නොගළවයි. මුහු කෙරෙහි තට භය නැති"
(අ) මෙහි "මුහු" යනුවෙන් හැඳින්වූයේ කවරකුද?
(ආ) මේ ප්‍රකාශය උපුටා ගත් මුල් කෘතියේ කතුවරයාගේ වෙනත් කෘතියක් නම් කරන්න.

(ix) (අ) තමා අකෘතඥයෙකු නොවන බව ගුරුතුමාට ඇඟවීම සඳහා රචනා කළ සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ සුප්‍රකට පද්‍ය කාව්‍යය කුමක්ද?
(ආ) ලඝු අකුරු දෙකකින් හා ගුරු අකුරකින් සෑදෙන 'කාව්‍ය ගණය' කුමක්ද?

(x) (අ) "අපි අද රට මේ පැලේ නතර වෙමු." මෙහි සඳහන් පැල පිහිටියේ කොහේද?
(ආ) 'ඔවා මුතු' කෘතියේ රචකයා නම් කරන්න.

(ලකුණු 2 x 10= 20)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

Past Papers Wiki

02) මෙහි සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

(i) "ගිරා පෝතකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා, උන් දෙදෙනා මන්ත්‍රණය කොට අන්තයෙහි දී සාල්ලෙක ලා ලා පාතට බාන කෙනකුන් මෙන්..."

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) මෙහි "ඒ මන්ත්‍රණය" යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්දැයි කෙටියෙන් ලියන්න.

(ii) "පුංචි මැණිකාගේ බඩගින්නට හා තෙහෙට්ටුවට ද මහල්ලාගේ කතාවෙන් උපන් සන්තාපයත් දුකත් එකතු විය."

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) මේ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) "රැති වනපෙතිනැවිදින් සුමුවෝයා
නිති මියුරැති වෙණ නදළමුයෝයා
සිති විලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් සමුවෝයා"

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) වීණා නාදයට ලොල් වූ මුවන්ගේ හැසිරීම් රටාව කෙටියෙන් ලියන්න.

(iv) "සොර ක්ලාන්ත වියැ. මියෙහි කෙළ සිඳී ගියේ. ශරීරයෙන් ස්වේද බස්සි."

(අ) මෙහි ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) මෙම පාඨය හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(v) "ප්‍රේමවන්ත දරුවෙනි මා
හිඳිනු කන්යොමා
කියමි පුවත සැක දුරුරා
අසන නිතියෙනා"

(අ) මෙහි "දරුවෙනි" යනුවෙන් අමතන්නේ කාටද?

(ආ) මෙහි කියන්නට යන "පුවත" කෙටියෙන් ලියන්න. (ලකුණු 4×5-20 යි)

03) උම්මග්ග ජාතක කතාවෙහි,

(i) මහෞෂධ පඬිතුමා සතු මානව හිතවාදී ලක්ෂණත්

(ii) කේවට්ට බමුණා සතු හිංසාකාරී ගති ලක්ෂණත් පිළිබිඹු වන අයුරින් චරිත නිරූපණය කොට ඇත. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්

(i) අභියෝග හමුවේ ශක්තිමත් වීමටත්

(ii) ගුණ දහමින් පෝෂණය වීමටත් උපදෙස් සැපයීම මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තිය රචනයේ අරමුණ වී ඇත. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න. (ලකුණු 15)

04) බැද්දේගම ගැමියන්

(i) පරිසරයෙන් පීඩා විඳින අයුරුත්

(ii) අග හිඟකමින් හා අසරණකමින් පීඩා විඳින අයුරුත්

බැද්දේගම නවකතාවෙහි නිරූපණය කර ඇත්තේ පාඨක සිත සසල කරවන අයුරිනි. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්

(i) අජීවී වස්තුවකට සජීවීබවක් ආරෝපණයත්

(ii) ධ්වනිකාර්ථවත් ජීවන දර්ශනයත්

හේතු කොට ගෙන ගංගාවේ සංගීතය සාර්ථක පද්‍ය නිර්මාණයක් වී ඇත. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න. (ලකුණු 15)

05) අවස්ථා හා සිද්ධි නිරූපණයට අමාවතුර කතුවරයා දැක්වූ දක්ෂතාව 'අඟුල්මල් දමනය' කතාවෙන් පැහැදිලි වන අයුරු නිදසුන් තුනක් දෙමින් විමසන්න. (ලකුණු 10)

06) එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්ගේ කාව්‍යෝපක්‍රම භාවිතය සිංහබාහු නාට්‍යය පාඨක ප්‍රශංසාවට ලක්වීමට හේතු වී ඇති අයුරු නිදසුන් තුනක් දෙමින් විමසන්න. (ලකුණු 10)

07) සිය අත්දැකීම් ඇසුරින් සර්වකාලීන වූ උපදෙස් සැපයීම ජන කවියාගේ අරමුණයි. 'හානාහිය පානා අඬහැරෙන් දැනේ' පද්‍ය පන්තිය ඇසුරින් නිදසුන් තුනක් දක්වමින් විමසන්න. (ලකුණු 10)

CamScanner

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අනාවරණ පරීක්ෂණය - 2026

11 ශ්‍රේණිය - සිංහල භාෂාව හා සාහිත්‍යය

ආදර්ශ උත්තර හා ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය

(1)	3		(11)	3		(21)	2		(31)	3
(2)	2		(12)	1		(22)	1		(32)	4
(3)	4		(13)	4		(23)	3		(33)	1
(4)	3		(14)	2		(24)	4		(34)	1
(5)	1		(15)	1		(25)	2		(35)	3
(6)	2		(16)	3		(26)	1		(36)	2
(7)	3		(17)	1		(27)	2		(37)	4
(8)	1		(18)	2		(28)	1		(38)	2
(9)	3		(19)	1		(29)	1		(39)	3
(10)	4		(20)	4		(30)	2		(40)	1

(ලකුණු 1×40 = 40)

II පත්‍රය

01)

(i) (අ) ක,ච,ට,ත,ප (ආ) (අ):,ශ,ෂ,ස,හ,ෆ
ඛ,ඡ,ඨ,ථ,ඵ
ශ,ෂ,ස,ෆ,(අ):

(ii) සලකුණු, සුවිශේෂ,

(iii) (අ) පුනර් + උච්චාරණය

(ආ) නෙලුඹු + දණ්ඩ

(iv) (අ) විදේශිකයෙක් වනසතුන් නැරඹීය/නැරඹුවේය.

(ආ) තරුණයන් විසින් රැකියා ඉල්ලා උද්ඝෝෂණය කෙරෙයි/ කරනු ලබයි/ කරනු ලැබෙයි/කරනු ලැබේ.

(v) (අ) බිව්වා/බීවා (ආ) හිටියා

(vi) (අ) නීත්‍යනුකූලභාවය (ආ) අත්‍යවශ්‍ය

(vii) (අ) ශ්‍රේෂ්ඨතර (ආ) ශ්‍රේෂ්ඨතම

(viii) (අ) අමාවතුර, ධර්මප්‍රදීපිකාව, පූජාවලිය, බුත්සරණ

(ආ) කොස්, තේක්ක, දෙමට, බුරුත

(ix) (අ) හෙල - ප්‍රපාතය යන අර්ථයද

(ආ) හෙළ - සිංහල/සුදු යන අර්ථයද පැහැදිලි වන සේ ලියා ඇති නිවැරදි වාක්‍ය සඳහා ලකුණු දෙන්න.

(x) පහත සඳහන් අදහස්වලට උචිත ඡත්‍ර පදය බැගින් ලියන්න.

(අ) උභයජීවීන්

(ආ) ක්ෂිතිජය (ලකුණු 2 × 10 = 20)

02) ලකුණු විග්‍රහය

• සාරවත්භාවය, මාතෘකාව ඇතුළුව -	ලකුණු	08යි
• සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය -	ලකුණු	12යි
• ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම -	ලකුණු	05යි
	• මුළු ලකුණු	25යි.

03)

• අන්තර්ගතය -	ලකුණු	06යි
• වචන ගණන -	ලකුණු	02යි
• ශිල්පීය දක්ෂතා -	ලකුණු	02යි
	• මුළු ලකුණු	10යි.

<u>අවධානයට</u>

- වචන ගණන 50ට අඩු කල්හි සහ 60 වැඩි කල්හි ලකුණක් අඩු කර එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
- ඡේද බෙදා තිබුණහොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
- දුර්වල සාරාංශ සඳහා බින්දුව නොදී ලකුණු 03ක උපරිමයකට යටත්ව ලකුණු පිරිනමන්න.

04) (i) දහනව වන ශතවර්ෂයේ දී

(ii) සත්‍ය සිද්ධියක් නැතහොත් සම්පූර්ණයෙන් කල්පිත ස්වරූපයෙන් හෝ නිර්මාණය කරනු ලබන නිසා

(viii) නවකතාව, කෙටි නව කතාව, කෙටි කතාව

(iv) ප්‍රබන්ධ කතාවේ ආරම්භය හා විකාසනය පිළිබඳ කරුණු දැක්වීම

(v) (අ) සිතින් මවාගත්/මනසින් මවාගත්/උපකල්පිත/හිතලු

(ආ) වර්ධනය වීම/ විහිදීම

(ලකුණු 2×5 = 10)

05) • අන්තර්ගතය - ලකුණු 08යි

• ආකෘතිය - ලකුණු 04යි

• ශිල්පීය දක්ෂතා - ලකුණු 03යි

• මුළු ලකුණු 15යි.

III පත්‍රය

01) I) අ) උත්තර පංචාල නුවර ආ) මියුලු නුවර/ මිථිලා

ii) අ) සවිසිමත්/ විසි හයමත් විරිත

ආ) රූ රැසේ අඳිනා ලෙසේ/ රන් රසේ එක්වන ලෙසේ

iii) අ) රවින්ද්‍රනාත් තාගෝර්තුමා

ආ) සුවඳ

iv) අ) අනුන් ලියන් දැක තම ලියට තල තලා

දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

ආ) පරමත්ථ ජෝතිකා

v) අ) බබුන් ජීවත්ව සිටීද නැද්ද යන වග

ආ) ඒ.පී.ගුණරත්න

vi) අ) ශෛලිගත/ නාට්‍ය ධර්මී

ආ) ගතානුගතිකත්වය හා නූතනත්වය අතර සදාකාලික ප්‍රතිවිරෝධය

vii) අ) අමරා දේවිය ආ) තලතා දේවිය

viii) අ) අංගුලිමාල තෙරුන් වහන්සේ ආ) ධර්ම ප්‍රදීපිකා

ix) අ) ගුත්තිල කාව්‍යය ආ) වායු ගණය

x) අ) පල්ලේගම කෝලානේ ආ) එස්. මහින්ද හිමි

(ලකුණු 2×10=20)

02) i) අ) ඒ සාකච්ඡාව අසා නිමවා

පැසක/මල්ලක යොදා

ආ) පළමුව කුඩා නුවරක් වටකොට ගනුම්හ. රහස් දොරටුවෙන් ඇතුළු නුවරට වැද ඒ රජ්ජුරුවන්ට 'දේවයනි, තොප හා අප සටන් කොට කාරියක් නැති. හුදෙක් අප නතු වුව කියා ක්‍රමයෙන් රාජ්‍යය යටපත් කරගෙන සියලු දෙනා එක් රැස් කර රා මණ්ඩලයක් සාදා විෂ මිශ්‍ර රා අනුභව කරන්නට දී හැම දෙනාගේම ජීවිත විනාශ කිරීම.

ii) අ) තෙහෙට්ටුව- මහන්සිය/විඩාව

සන්තාපය- කනගාටුව/ සිත් වේදනාව

ආ) පුංචි මැණිකා බබුන් සොයා හිර ගෙදරට යන අතරමග හිර ගෙදර අසලදී හමුවූ මහල්ලා සමඟ කතා බස් කළ අවස්ථාව

iii) අ) සුමුවෝයා- සමූහ/රංචු පිටින් සමුවෝයා - සම්මුඛව/හමුව

ආ) මිනිසුන් ගැනද හැඟීමක් නැත· සිත්කලු වනපෙතින් රංචු පිටින් පැමිණ වීණා නාදයේ මිහිර හේතුවෙන් අරින ලද මුඛය ඇති මුවෝ සිතුවිලි නැති රූප විලස මිනිසුන් හමුවේ බියක් නැතිව සිටිති'.

iv) අ) මියෙහි- කටෙහි/මුවෙහි ස්වේද- දහඩිය

ආ) බුදුන් වහන්සේ පසු පස අංගුලිමාල හඹා යන අයුරු කෙටියෙන් සඳහන් කර තිබේ නම් ලකුණු දෙන්න.

v) අ) සිංහබාහුට සහ සිංහසීවලීට

ආ) තමා වංග දේශයේ රාජ කුමාරිකාව බවත් රජ සැප හැරදා වනයේ දී හමු වූ සිංහ රාජයෙකු සමඟ පැමිණි බවත් (ලකුණු 4 × 5 = 20)

03) **මහෞෂධ පඬිතුමා සතු මානව හිතවාදී ලක්ෂණ**

"මා බඳු පණ්ඩිත කෙනෙකුන් ජීවත්වැ හින්ද දීම මෙතෙක් රජ දරුවන් මියයාම යුක්ත නොවන්නේය. උනට මා පිටුවහල් වුව මැනැවැ´ යි සිතා

" එය මට භාරය· 'සටනෙකැ'යි සිතක් නොතබා භය නොගෙන සුව සේ රාජ්‍ය ශ්‍රී අනුභව කළ මැනව´යි කීසේක.

''පින්වත්නි, තොපි හැම සතුරෝ වටලා ගත්තෝ වේදැ'යි නොසිතා, මල් ගඳ විලෙවුන් හා අටලොස් වර්ගයේ කැවුම් හා රා මස් ආදී නොයෙක් අන්නපාන සපයා වස්ත්‍රාභරණයෙන් සැරසී උත්සවයට පටන් ගනුව, කරුණානිධාන වූ මාගේ ස්වාමී දරුවාණෝ 'බිඳී යන්නවුන් ලුහුබඳව' යි යන බසකුත් නොකියා තමන් වහන්සේගේ සේනාව පිරිවරා නුවරට වන් සේක.

ආදී උචිත උදාහරණ ගෙන විස්තර කළ යුතුය.

කේවට්ට බමුණා සතු හිංසාකාරී ගති ලක්ෂණ.

*එක් සියයක් රජ දරුවන් අපගේ නුවරට ගෙනවුත් උයනෙ දී රා මණ්ඩලයක් සාදා උන් හැම දෙනා 'රා බොන්නට යැ 'යි රා මැඩිල්ලේ හිඳුවාලා විෂ යොදා කරන ලද්දාවූ රා අනුභව කරවා උන් හැම දෙනාම ජීවිත විනාශයට පමුණුවා ගඟ දියට දමා එක් සියයක් රාජධානියෙහි රාජ්‍ය අත්පත් කොට ගනුම්හ

"වන්නා ව මහරජ, නුවරට පැන් නම් පිටතින් වන්නේ ය· කීප දවසක් පැන් නවතා ලන්නා පැන් නොලදින් ක්ලාන්ත වූවාහු දොර ඇර පියන්නා හ.

*නුවරට වී සාල් නම් පිටතින් ම වන්නේ ය. ඒ වී සාල් වැද්ද නො දෙම්හ· බතින් පීඩිත වූ මනුෂ්‍යයෝ දොර ඇර පියන්නා හ. එවිට අල්ලාගෙන කැමැත්තක් කරම්හ.

ආදී උචිත උදාහරණ ගෙන විස්තර කළ යුතුය.

නැතහොත්.

අභියෝග හමුවේ ශක්තිමත් වීමටත්

***කරදර බාධක හමුවේ නොසැලී සිටීම.**

කරදර දහසක් හමු වී
ඉන්ටැකි නම් සිනා වෙවී
ඔහු මෙලොවට පහළ දෙවි
රජකැයි සලකනු මැනවි

• යුතුකම් ඉටුකර ගැරහුම් ලැබුණ ද ඉවසා දරාගෙන සිටීම.

කොට කළ යුතු යුතුකම්
ලැබුනත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුලුවන් නම්
නුඹයි මගේ පුතා උතුම්

• අභියෝගයක් වන නැති බැරිකම්, අගහිඟ හමුවේ කටයුතු කිරීම

කාටත් හිමි පොදු දේ නම්
නැති- බැරි ,හිඟ අවහිරකම්

මේ දේ මැඩගෙන දස්කම්
පෑම තමයි සුරු විරුකම්

ගුණ දහමින් පෝෂණය වීමටත්

• බුදු දහමෙහි පහස කුඩා කල සිට ම ලැබෙන බව

මුනි සිරිපා සිඹිමින්නේ
සමනොළ ගිරි පෙදෙසින්නේ
මඳ සුළඟයි මේ එන්නේ
මගේ පුතා නිදියන්නේ

• තමා සතු යුතුකම් ඉටු කිරීම

නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහි කොට මෙ ලොවේ
යුතුකම් ඉටු කළ යුතු වේ

***කිසිදු භේදයකින් තොරව මිත්‍රත්වය ගොඩනගා ගැනීම.**

මිතුරු කමින් පෙරට එතොත්
දූවිල්ලක් එක්ක වුණත්
මිතුරු වෙයන් පුතේ උඹත්
එයයි ලොවේ ගුණය මහත්

***සංවේදී හදවතක් සහිත දරුවෙකු වීම.**

සිනිඳු මොළොක් බව මලෙහි
පිරිසිදු බව පිනි බිඳෙහි
එක් වී මා පුතුගේ ළෙහි
අරක් ගනී හැම දිනෙහි

වෙනත් යෝග්‍ය උදාහරණ මඟින් විස්තර කර ඇත්නම් ඒවාද පිළිගන්න. (ලකුණු 15)

04) **පරිසරයෙන් පීඩා විඳින අයුරුත්**

ඒකාකාරී ජීවිතයත්, දැඩි උණුසුම් වාතය සමඟ කෙළවරක් නැති ගසුත්, කෙළවරක් නැති කම්කටොලුත් හමුවේ ඔවුන්ගේ චේතනා ශක්තියත්,කල්පනා ශක්තියත්, වේදනා ශක්තියත් විලීනව මිය යන්නේ ය.

අව්ව හා සුළඟත් වෙහෙසත් බඩගින්නත් ලෙඩ දුකත් ශරීර ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද උරා බොයි. ඇගේ සම ඇටයට ඇලී රැලි වැටී ගියේ ය. ළැම වියැළී ගොසින. මේ ගම්වල ගැහැනියක් අවුරුදු තිහ හතළිහ වන විටත් මැහැල්ලකි.

*එය කුඩා කුඩා ගමකි. ක්‍රමයෙන් පිරිහී ගොස් අවටින් තෙරපා ගෙන එන මහ බැද්දට බත් වී යන වනගත කුඩා ගම් වලින් එකකි. එක පහරකට එක දවසකින් එහි තිබුණු ගෙවල් හයෙන් එකක් නැති විය.

එහෙන් ආරච්චිගේ ගෙදරට කැලය කඩා වැදීමෙන් වූයේ ගම දෙකකට බෙදී යාම ය. සිළිදුගේ හා බස්තියන් අප්පුගේ ද ගෙවල් දෙක ගමේ අනිත් ගෙවලින් වෙන් වූ බව දුටු ගම්මු තමන් ජීවත් වන්නේ විනාශ වේගෙන යන ගමක බව තේරුම් ගත්හ.

අගහිඟ කමින් හා අසරණ කමින් පීඩා විඳින අයුරුත්

*පුංචි මැණිකාට හා කරලිනාහාමිටත් වේලක් ඇර වේලක් කා මාස හයක් ගත කර ගැනීමට සෑහෙන තරම් ධාන්‍යයක් වත් ගෙයි ඉතිරි වී නො තිබුණේය.

*ආරච්චිගේ මරණයෙන් පසුව ආරච්චි හාමිනේ- නැංවොහාමි ගම හැර යන්ට තීරණය කරගත්තා ය. හේන් වැඩ කිරීමට තරම් නො වැඩුණු දරුවන් සමඟ තව ඉදිරියටත් බැද්දේගම වාසය කිරීමට ඇට පිළිසරණක් නැත.

*බිස්සේ තිබුණු කුරක්කන් ටික ඉක්මනින් ම ඉවරව ගිය හෙයින් කෑ හැකි කොළ වර්ග, අල වර්ග හා පලතුරු ද සෙවීමට ඈ වනයට ගියා ය. හේන් වාරයට අනුන්ගේ හේන්වල බස්තියන් අප්පුගේ බාල අප්පුගේ හා පුංචිරාළගේ හේන් වල පවා ඇය වැඩ කළා ය.

*පිළියෙළ කරගත් කුරක්කන් රොටි කිහිපයකුත් ගමන ගැන ඇසූ ගම්මුන්ගෙන් ලැබුණ තවත් ධාන්‍ය ඇට ටිකකුත් ලේන්සුවක ඔතාගෙන ඈ කඹුරුපිටිය බලා පිටත් වූවා ය.

නැතහොත්

අජීවී වස්තුවකට සජීවී බවක් ආරෝපණයත්

*කඳු බෑවුමක දං-බෝවිටි පඳුරු තළා
පහළට ඇදී පර මල් පෙති ඉවත නොළා
කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා
සංගීතවත් වී යම් ඉදිරියට ගලා

*සැඟවෙමි-එබෙමි- නිසසල වෙමි-සසල වෙමි
ඇඹරෙමි-එහෙත් පසු නොබසිනු නොනවතිමි
කවදා කොතැනකදි හෝ මහ මුහුද හිමි
හමුවුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි

"හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරිතම
ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම
සම තැනිතලාවල හමුවෙයි අලසකම
නිරසයි අතරමඟ අවහිර නුදුටු බිම

ධ්වනිකාර්ථවත් ජීවන දර්ශනයක්

*කදු බෑවුමක දං බෝවිටි පඳුරු තලා
පහළට ඇදී පර මල් පෙති ඉවත නොළා.....

ගංගාව මනුෂ්‍ය ජීවිතයට ආදේශ කර ජීවිතයට පැමිණෙන්නා වූ දුක් කම්කටොලු බාධකයන් ඉදිරියේ නොසැලී ඒවා පන්නරයක් කර ගනිමින් ජීවිතයේ ඉදිරියට ම යා යුතුය.

"එන්නේ කොයි සිට ද-කොතැනකට ද යන්නේ
ඔබ කුමකට ද මා දුටු තැන විමසන්නේ.....

මිනිසාගේ සංසාරික ජීවිතයේ සංකේතයක් ලෙස ගඟ දක්වමින් කවියා සංසාර ගමන පිළිබඳ අපූරු ජීවන දර්ශනයක් ගෙනහැර පායි.

*සම තැනිතලාවල හමු වෙයි අලසකම
නිරසයි අතරමඟ අවහිර නුදුටු බිම.....

මිනිස් ජීවිතයේ ආරම්භයේ සිට අවසානය දක්වා විවිධ හැලහැප්පීම් හමුවේ ඉදිරියට ගලාගෙන යන බව.

*නොමියන හේලි දහමක පණිවුඩය පිට
කොඳුරමී කෙදිරියක් මුළු ලොව නිසල කොට.....

ජීවන ගමන පිළිබඳ බෞද්ධාගමික ආභාසයෙන් යුතුවූ සිතුවිලි සමුදායක් ගොඩ නගයි.
වෙනත් යෝග්‍ය උදාහරණ මගින් විස්තර කර ඇත්නම් ඒවා පිළිගන්න. (ලකුණු 15)

05) අවස්ථා හා සිද්ධි නිරූපණය

*කොසොල් රජහුගේ හර්ග නම් පුරෝහිතයා පිණිස මන්තාණී නම් බැමිණි ගබ් ගෙනැ රූ පුතකු ප්‍රසව කළා . මවුකුසින් නික්මෙන කලැ සියලු නුවර ආයුධ දිලිණ. (අහිංසක කුමරු ගේ උප්පත්ති අවස්ථාව)

*ආචාර්ය ඔවුන් තමා සතා ඇති වැ බණන සේ දැකැ ඇය හා ඔහු සසඟ ඇති සෙ යැ 'යි බිඳී 'ඔහු මරමි' සිතී (ආචාර්යවරයා අහිංසක කුමාරයා මැරීමට සිතූ අවස්ථාව)

*හේ හැම අරණ්‍යයෙහි හසර නැති කෙළෙ• දර පලා සඳහා වල් යන්නාහු නැති. රෑ ගමට වැද පයින් පැහැර දොර ගලවා -පියා එහි හොතුවන් මරා-පියා 'එකෙකැ දෙකෙකැ' යි ගැණැගෙන යෙයි. (අංගුලිමාල මිනිසුන් මරමින් කැලෑවෙහි සිටීම නිසා මිනිසුන් පීඩාවට පත්වූ අවස්ථාව)

*ඒ දවස් බුදුහු දෙව්රම්හි වෙසෙමින් අලුයම් සමාහි ලොබලන්නාහු අඟුල්මල් සොරහු දැකැ 'මා ගිය කලැ ඔහුට සෙත් වෙයි'

(බුදුන් වහන්සේ දිවැසින් ලොව බලන විට අංගුලිමාල දකින අවස්ථාව)
වෙනත් යෝග්‍ය උදාහරණ මගින් විස්තර කර ඇත්නම් ඒවා පිළිගන්න. (ලකුණු 10)

06) කාව්‍යෝපක්‍රම භාවිතය

***උපමා භාවිතය**

පින් පිඬ වැනි මා මැණිය
කියනු නොවලහා
ඇයි ද වල් කලා පොරවා
ලෙන තුළ ඉන්නේ

*සියලු භෝග වස්තු ඉසුරු
හරිති නෙක් දනෝ
ස සැප දෙන සිතුමිණ වන් ප්‍රේමය සන්දා

*සේ රිවි බිම්බා පතළ සෙද බලැති මහ රූ
මෙන රන් ටැම්බා නිසසල ගුණයෙන් සපිරි රූ

***අනුප්‍රාසාත්මක වදන් භාවිතය**

තුමුල ගතින් දා
බාහු බෙලෙන්දා
වෙමි සේ තිදසින්දා.
කුරිරු ගිජින්දා
කුඹු තල සින්දා
ලමී සේ කෙසරින්දා

වෙනත් යෝග්‍ය උදාහරණ මගින් විස්තර කර ඇත්නම් ඒවා පිළිගන්න. (ලකුණු 10)

07) සිය අත්දැකීම් ඇසුරින් සර්වකාලීන උපදෙස් සැපයීම

*ගසට කෙටුම ගස මුල පෑයුමෙන් දැනේ
මිනිහා නොමිනිහා යන කඩිසරින් දැනේ
අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ
හානා හීය පානා අඬහැරෙන් දැනේ

*නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කුරීන් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිළවුංට ඉනිමං කමක් නැත

*ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු

බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු

කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනු

තමන්ගේ තරම දැනගෙන කල් කල් හරිනු

*ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද


දත් නැතිදා උක්දඬු ගිනි තපින්ට ද

වෙර නැතිදා ගහගත්තේ දිනන්ට ද

යුධ නැතිදා නැති කග කොස් කොටන්ට ද

යනාදී පද්‍යයන්හි දක්නට ඇති උපදේශාත්මක යෙදුම් තුනක් සහිතව කරුණු විස්තර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300




Rs : 300



Rs : 300




Rs : 300




Rs : 300



Rs : 300



Rs : 350



Rs : 300



Rs : 300



Rs : 200




Rs : 200



Rs : 200



Rs : 250




Rs : 250




Rs : 200




Rs : 200



Rs : 200



Rs : 300




Rs : 300




Rs : 200



Rs : 200



Rs : 250




Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE